# බළන්ගොඩ නගර සභාව
## 2023-01-11 වන දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2023.01.11**

**වේලාව - පෙ.ව. 10.30**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්. ඒ. වසන්ත ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්.ටී.එම්.රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්. විමලසිරි මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එස්.ඒ.ජෝර්ජ් මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය |

**නිලධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | ඩී.එම්.ජේ.යූ.ධර්මරත්න මයා |

ගරු සභාපතිතුමන් විසින් මෙදින විශේෂ මහ සභාව සඳහා සහභාගි වූ ගරු නාගරික මන්ත්‍රීවරුන් ඇතුළු සියළුම දෙනා පිළිගනිමින් ආගම සිහි කිරීමෙන් අනතුරුව ගරු සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මෙදින විශේෂ මහ සභාව සඳහා සහභාගි වූ ගරු නාගරික මන්ත්‍රීවරුන් ඇතුළු සියළුම දෙනා පිළිගනිමින් ගරු සභාවේ වැඩකටයුතු ආරම්භ කරන ලදි. 2023 පෙබරවාරි මස 01 වන දින සිට 2023 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ කාලයක් සඳහා,

I. පොදු වෙළඳසැල අංක 11 දරණ මාළු කඩ කාමරය
II. පොදු වෙළඳසැල අංක 15 දරණ එළු මස් කඩ කාමරය

III. පොදු වෙළඳසැල අංක 16 දරණ ගව මස් කඩ කාමරය
IV. බලන්ගොඩ නගර සභාවට අයත් සභාව සතු දැන්වීම් පුවරු 10

සඳහා කැඳවන ලද ටෙන්ඩර්පත් විවෘත කිරීම හා සුදුසු බදුකරුවන් තෝරා ගැනීම සඳහා කැඳවන ලද ටෙන්ඩර්පත් විවෘත කිරීම හා සුදුසු බදුකරුවන් තෝරා ගැනීම වෙනුවෙන් මෙදින විශේෂ මහ සභාව පවත්වන බැවින් ඒ සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදි.

ටෙන්ඩර් පත් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්. රුමි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කර ගන්නා ලදි.

ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ලද පහත සඳහන් තීරණ සියල්ල ගරු සභාපතිතුමන් විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදි.

- පොදු වෙළඳසැල අංක 11 දරණ මාළු කඩ කාමරය සඳහා ටෙන්ඩර් අයදුම්පත්‍ර 01 ක් නිකුත් වී තිබුණු අතර, එම අයදුම්පත්‍රය ලැබී තිබුණි. එහි දී මිත්‍රිගේ සුරංග මැණික් මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලංසු මුදල වන රු. 10,150.00 ක මුදල පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.
- පොදු වෙළඳසැල අංක 15 දරණ එළු මස් කඩ කාමරය සඳහා අයදුම්පත්‍ර 01 ක් නිකුත් වී තිබුණු අතර, එම අයදුම්පත්‍රය ලැබී තිබුණි. එහි දී අබ්දුල් මුත්තාලිප් මොහොමඩ් රෙමේෂීන් මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලංසු මුදල වන රු.10,500.00 ක මුදල පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.
- පොදු වෙළඳසැල අංක 16 දරණ ගව මස් කඩ කාමරය සඳහා අයදුම්පත්‍ර 01 ක් නිකුත් වී තිබුණු අතර, එම අයදුම්පත්‍රය ලැබී තිබුණි. එහි දී මොහොමඩ් රියාල් මරික්කාර් අන්වර්දීන් මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලංසු මුදල වන රු.402,000.00 ක මුදල පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.
- බලන්ගොඩ නගර සභාව සතු දැන්වීම් පුවරු 10 සඳහා එක් අයදුම්පත්‍රයක් නිකුත් වී තිබුණු අතර, එම අයදුම්පත ලැබී තිබුණි. එහි දී අසමානගේ සුමිත් කුමාර මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලංසු මුදල වන රු. 31,300.00 ක මුදල පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ලද ඉහතින් ලබාගත් තීරණ ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරමින් ගරු සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

අනතුරුව ගරු සභාපතිතුමා විසින් අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය හා කාර්ය මණ්ඩලය සඳහා ස්තූතිය පුදකරමින් පෙ.ව 10.50 ට පමණ විශේෂ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදි.

එම්.ටී.එම්.රුමි,
සභාපති(වැ/බ)
බළන්ගොඩ නගර සභාව.